සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# සිංහල සාහිත්‍ය රසාස්වාදය

11 ශ්‍රේණිය | කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

- I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7, ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(1) (i) සිට (v) දක්වා කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'අපට ඒ ඇතිව තිබූ ධන සත ම දෙන නියායෙන් තුලුන් මහණ කරව.'

(අ) මෙහි 'තුලුන්' යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන්ද?

(ආ) මෙම පාඨය උපුටාගත් කතාව ඇතුළත් මුල් කෘතිය කුමක්ද?

(ii) 'නුඹ වහන්සේ සැකයක් නොසිතුව මැනව. කීප දවසකින් උන් නුඹ වහන්සේ වශයට පමුණුවා සාමර්ථ්‍යය දක්වාලමි.'

(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කා විසින්ද?

(ආ) 'නුඹ වහන්සේ' යනුවෙන් ආමන්ත්‍රණය කළේ කාහටද?

(iii) 'එයා අපට ජීවත් වෙන්ට ඉඩ ඇරලා ගියා. එයා නම් ඩොක් ගාලා කම්මුතු වුණා.

(අ) ප්‍රකාශය කළේ කවරෙක්ද?

(ආ) මෙම ප්‍රකාශය උපුටාගත් කෘතියේ කතුවරයාගේ නම කුමක්ද?

(iv) කෙතෙක් ගුණ කළත් සුදනන් හට **අසුබ**
අකක් පමණවත් නොම කෙරෙති **පිළිලබ**
ඒ උක් රසෙහි සැඳුවත් නිඹ බිජු **කිරඹ**
උදක් තිත්තමය පසඟම තුරෙහි **නිඹ**

(අ) මෙහි මුල් කවි පද දෙකේ අදහස ලියන්න.

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(v) ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහි වී මගේ කම්මුල රතු පැහැය ගතී

(අ) මෙම පැදි පෙළේ රචකයා කවරෙක්ද?

(ආ) 'සිහිවී මගේ කම්මුල රතු පැහැය ගතී' යන්නෙන් මතු කෙරෙන අදහස කුමක්ද?

(ලකුණු 4 × 5 = 20)

(2) පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කර ගෙන රසාස්වාදයක් ලියන්න.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නැඟියි උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරි ගී මඳනල හමන විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙය බව සලකනු පුරුදු නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය මත
උගතිමි කිම ද මිනිසා සතු දෙ නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතහෙි හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන ඉටී

බඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

(i) මෙම පද්‍ය පන්තියට වස්තු විෂය වී ඇත්තේ කුමක්ද?

(ii) කවියා යොදාගෙන ඇති ආකෘතිය එම අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා උචිත වන්නේ කෙසේද?

(iii) කවියා තම අත්දැකීම් ප්‍රබලව ඉදිරිපත් කිරීමට යොදාගෙන ඇති ව්‍යංග්‍යාර්ථවත් යෙදුම් 02 ක් විග්‍රහ කරන්න.

(iv) කවියා යොදාගෙන ඇති භාෂාව රස නිෂ්පත්තිය උදෙසා කොතෙක් දුරට ගැළපේ ද?

(v) 'මෙම පැදි පෙළ කාලීන වටිනාකමකින් යුක්ත නිර්මාණයකි.' ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 5 × 5 = 25)

## II කොටස

(3) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක** කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

එකල බුදුහු තිබී බලවත්වන ලෙඩක් බෙහෙදක් දී සන්සිඳුවන කලක් මෙන් ඔබගේ එබඳු අනුභාවයක් නැතත් තමන් වහන්සේගේ අනුභාවයෙන් අත අල්වා ගෙන තව්තිසා දෙව්ලෙවට වඩනා සේක් අතුරුමඟ නවදැලි සේනක් මවාලා ඒ සේනේ දා ගිය කණුවෙක දා වක ගසී ගිය වැඳිරිමැල්ලක මවාලා තවුතිසා දෙව් ලොවට වැඩ සක්දෙව්ඳුහුගේ පන්සියයක් පමණ දෙවඟනන් පැලා 'කුමක් ද නන්දයෙනි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවූ කලණ බිසව් යහපත්තු දැයි විචාළ සේක.

ස්වාමිනී, කුමක් වදාරන සේක් ද මේ දෙවඟනන් දුටු කලට ඒ දනවු කලණ බිසව් නම් අතුරුමඟ නවදැලි සේනේ අප දුටු දා වක ගැසී ගිය වැඳිරිමාල්ලක් වටිත්දැ'යි කී සේක. ඒ අසා බුදුහු 'එසේ වී නම් නන්දයෙනි, ශාසනාභිරතිය ඇති ව සිල් ආරක්‍ෂා කළේ නම් කෙලෙසුන් ගෙවා ගන්ට නුවුවොත් දෙව්ලොව ඉපිද දෙවඟනන් ලබන නියාමට මම ඇපයෙමි'යි වදාළ සේක. ඒ අසා නන්ද තෙරුන් වහන්සේ 'එසේ වී නම් දෙමඟනන් ලබන නියාවට මේ තරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි'යි කී සේක. මෙලෙසින් සස්නෙහි ඇලුම් ඇති කරවා හැදහිලි නැති කෙනෙකුන් ප්‍රසිද්ධ ස්ථානයට ගෙන ගොස් තරග කරවා රුවි දෙය කරවා ගන්නා සේ සිල් රක්‍ෂා කිරීමට දෙව්ලොව ගෙන ගොසින් තරය කරවා ගෙන නන්ද තෙරුන් වහන්සේ හැරගෙන දෙව්ලොව වැඩ උන්වහන්සේට ඇප වූ නිසාව නොහගවන්නට කරන්නාක් මෙන් දෙව් ලෙව දී අතුරුදන් ව.....

(i) මෙම උද්ධෘතය ඇසුරෙන් නන්ද තෙරුන්ගේ කෙබඳු චරිත ලක්ෂණ ඉස්මතුවේද? (ලකුණු 5 )

(ii) ධර්මසේන හිමියන් අපූර්වත්වයෙන් යුතුව භාෂාව හසුරුවා ඇති බවට නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 5 )

(iii) ඡේදයෙහි ඇතුළත් උපමා දෙකක් උපුටා දක්වන්න. (ලකුණු 5)

(iv) ඡේදයට අනුව නන්ද තෙරුන් වහන්සේගේ ගැටලුව විසඳා ගැනීම උදෙසා බුදුරජාණන් වහන්සේ කටයුතු කළ ආකාරය විමසන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25 යි.)

<u>නැතහොත්</u>

මගක් නම්
පියවර මතින්
පියවර තබා
තැනූ මගක් ම යි
අතර මඟ ළත නොවී
මුව දොර සොයා යන
ගඟක් ම යි

සිය දහස්
කෝ වේ හමුවනා
මං සන්ධි පසුවන
අතවනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා

මගකට දොසක් නොකියන්
නැත ඊට නිසි කාරණා

අම්බලම්
විසිතුරු සල්පිලෙන්
වටරවුම්
පදික මල් වැටෙන්
සෙවණලු සදන
තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා

මොහොතක ඉසිඹු
ලබනා විනා
නැත අතරමග
නතරවන වාසනා

මඟක් නම්
ඒ මඟක් ම යි
නොමඟක් නොවෙයි
මඟ නවතිනා

(i) කවියා මෙම පද්‍ය පන්තිය මගින් සහෘදයාට ඉදිරිපත් කරන අත්දැකීම කුමක්ද? (ලකුණු 05)

(ii) පද්‍ය පන්තිය රසවත් කිරීම සඳහා කවියා උපයුක්ත කර ගෙන ඇති කාව්‍යෝපක්‍රම දෙකක් හඳුන්වන්න. (ලකුණු 05)

(iii) කවි පෙළ සඳහා යොදාගෙන ඇති ආකෘතිය එහි සාර්ථකත්වයට කොතෙක් දුරට ගැළපේද යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) 'මඟ' කවි පෙළෙන් ඉස්මතු කෙරෙන ජීවන දෘෂ්ටිය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

## III කොටස

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න. (පිළිතුරක වචන 150 ක් වත් තිබිය යුතුය.)**

(4) තුංමංහන්දිය නව කතාවේ සාර්ථකත්වය උදෙසා කතුවරයා යොදාගෙන ඇති භාෂාව කොතෙක් දුරට ඉවහල් වී ඇත්දැයි විමසන්න. (ලකුණු 15)

(5) වැලපීම කෙටිකතාවේ සාර්ථක භාවයට එහි අවස්ථා හා සිද්ධි නිරූපණය බලපා තිබේ. පැහැදිලි කරන්න. (ලකුණු 15)

(6) කුස ජාතකය පාඨකයා තුළ අපූර්ව වාග්චිත්‍ර මැවීම එම කතා පුවතේ විශේෂත්වයකි. අවස්ථා 03 ක් දක්වමින් මේ පිළිබඳව විස්තර කරන්න. (ලකුණු15)

(7) සුභාෂිත කතුවරයා සමාජ සාරධර්ම විවරණය කිරීම සඳහා ස්වාභාවික පරිසරයත් එහි සිද්ධීනුත් යොදාගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න. (ලකුණු 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

(1) (i) (අ) රාහුල කුමාරයා

(ආ) සද්ධර්මරත්නාවලිය

(ii) (අ) කුදී

(ආ) කුරජුට

(iii) (අ) ඉයෝනා පොටපොෆ්

(ආ) ඇන්ටන් මෙකොෆ්

(iv) (අ) අසත් පුරුෂයන්ට කොතරම් යහපතක් කළත් අන් ගෙඩියක් පමණක්වත් ආපසු දීමක් නොකරති.

(ආ) නිඹ බිජු - කොහොඹ ඇට

පසඟ - පංචාංග

(v) (අ) විමලරත්න කුමාරගම මහතා

(ආ) අධික ලජ්ජාවට පත් වූ බව.

**II කොටස හා III කොටසේ** ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු ලියා ඇත්නම් ඒ සඳහා නියමිත ලකුණු ලබා දෙන්න.